# සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති පිළිබඳ ව මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක සූරීන්ගේ විග්‍රහය පිළිබඳ ව අධ්‍යයනයක්

අනුරින් ඉන්දිකා දිවාකර

*Sinhala Basha Vyakaranaya* written by Prof.W.S.Karunathilake (1995; 1st Ed, 2004;5th Ed) is one of the outstanding masterpieces that has been stood a test a of time along with the continuous standardization of other well expertised grammarians in the field. Prof.W.S.Karunathilake was a lingusits and a Grammarian. He was well versed in many languages and has wriiten few other significant books titled *Historical Linguistics* (1989), *Bhasha Samiiksha* (2005), *Fundamentals in Sinhala Linguistics* (1991), *An Introduction to Spoken Sinhala* (1992)" and also an unique English translation of *Sidath Sangarawa* together with James W.Gair. Not only that but also, he has published many resarch articles and journal articles in contribution to the Sinhala language. The book titled *Sinhala Bhasha Vyakaranaya – Sinhala Grammar* is the sourse of this work. The work captures the salient points of standardization, modernization and reformation of *Sidath Sangarawa* by Sinhala Bhasha Vyakaranaya the grammar rules of *Sidath Sangarawa*.

විසිවන සියවසේ අවසාන දශකයට අයත් එමෙන් ම වර්තමානයේ බිහි ව ඇති **ව්‍යාකරණ** ග්‍රන්ථ අතුරෙන් වැදගත් ම කෘතිය වශයෙන් පොදු වියත් මතයෙන් සම්මතකරණය වී ඇති කෘතියක් හැටියට මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලකයන්ගේ (1995 ප්‍රථම, 2004 පස්වන මුද්‍රණය) **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතිය සැලකිය හැකිය. මහාචාර්ය කරුණාතිලකයන් වාග්විද්‍යාඥයෙකි.

© **ආචාර්ය අනුරින් ඉන්දිකා දිවාකර**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය



එමෙන් ම සිංහල භාෂා ව්‍යාකරණඥයෙකි. සිංහල භාෂාව මෙන් ම විවිධ භාෂා පිළිබඳ දැනුමින් යුත් කරුණාතිලකයන් **ඓතිහාසික වාග්විද්‍යාව (1989), භාෂා සමීක්ෂා (2005), සිංහල වාග්විද්‍යා මූලධර්ම (1991),** *An Introduction to Spoken Sinhala* (1992), James W. Gair සමඟ කළ **සිදත්සඟරා** ඉංග්‍රීසි පරිවර්තනය (2013) ,. ආදි සිංහල හා ඉංග්‍රීසි භාෂා ග්‍රන්ථ ද ශාස්ත්‍රීය මෙන් ම පර්යේෂණ ලිපි ද ලියා ප්‍රකාශයට පත්කොට ඇත. මහාචාර්ය කරුණාතිලකයන්ගේ ග්‍රන්ථ අතරින් මෙහි දී යොදාගෙන ඇත්තේ **සිංහල භාෂා ව්‍යාකරණය කෘතියයි. සිංහල භාෂා ව්‍යාකරණය කෘතියෙන් මහාචාර්ය කරුණාතිලකයන් සිදත්සඟරාවේ ඇතැම් ව්‍යාකරණ රීති සම්මතකරණය, ප්‍රතිසංස්කරණය හා නවීකරණය කොට ඇති ආකාරය මෙහි දී විග්‍රහයට හසු වෙයි.**

**මහාචාර්ය කරුණාතිලකයන්** විසින් ම තම ග්‍රන්ථය පිළිබඳ ව මෙන් ම **ව්‍යාකරණ රීති** හඳුන්වා දෙනු ලබන ආකාරයෙන් ම **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියෙන් වැදගත් කරුණු දෙකක් ඉස්මතු කොට ගත හැකිය.

1. සිංහල භාෂා ව්‍යාකරණය හදාරන ශිෂ්‍යයන් උදෙසා රචනා කිරීම
2. සිංහල භාෂා ව්‍යාකරණ කෘතිය ද පුරාණ ව්‍යාකරණ ග්‍රන්ථාභාසයෙන් සම්පාදනය කොට තිබීම ('සිංහල භාෂාව සම්බන්ධයෙන් ලියැවී ඇති සම්භාව්‍ය ව්‍යාකරණ ග්‍රන්ථ ආශ්‍රයෙන් මෙය සකස් කොට ඇත') (2004ඃ හැඳින්වීම).

**සිදත්සඟරා** කතුවරයා විසින් සිංහල අක්ෂර මාලාවත්, තවත් ව්‍යාකරණ ප්‍රයෝග විස්සක් පිළිබඳ ව කරුණු දැක්වීමට පළමු පරිච්ඡේදය වෙන් කරනු ලැබූව ද මේ කෘතියේ ඒ සඳහා පරිච්ඡේද දෙකක් වෙන් කොට ඇත. එහි දී **සිදත්සඟරාවේ** අමිශ්‍ර සිංහල භාෂාවට අකුරු තිහක් ඇතුළත් බව සඳහන් කරමින් දීර්ඝාක්ෂර හා අනුස්වාරය (බිංදුව) අක්ෂර මාලා ගත කිරීමේ යෝග්‍යතාව පෙන්වා දී ඇති අතර **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ මිශ්‍ර, ශුද්ධ සිංහල හා ව්‍යවහාර සිංහල හෝඩිය සේ හෝඩි තුනක් දක්වා තිබේ. මේ අක්ෂර මාලා තුන පිළිබඳ ව ම කරුණු දක්වන කතුවරයා ශුද්ධ සිංහල හෝඩිය වශයෙන් දක්වා ඇත්තේ **සිදත්සඟරා** හෝඩිය ම බව සඳහන් කොට ඇත.

ලිඛිත සිංහල භාෂාවෙහි භාවිත හෝඩි දෙකකි. **ශුද්ධ සිංහල හෝඩිය** හා **මිශ්‍ර සිංහල හෝඩිය** යනුවෙනි. සංස්කෘත, පාලි ආදී භාෂාවලින් සිංහලයට එකතු වී ඇති වචන මිශ්‍ර වූ භාෂාව ලිවීම සඳහා **මිශ්‍ර සිංහල** හෝඩිය භාවිත වේ. ගද්‍ය ලේඛනය සඳහා මෙම හෝඩියෙහි සංකේත යෙදේ. හෙළ හෝඩිය, එළු හෝඩිය නමින් ද හැඳින්වෙන **ශුද්ධ සිංහල හෝඩිය** ක්‍රි. ව. 14 වන සියවස පමණ වන තෙක් වූ පද්‍ය භාෂාවේ ලේඛනය ඇසුරින් **සිදත්සඟරා** කතුවරයා විසින් සූත්‍ර ගතකොට ඉදිරිපත් කරන ලද්දකි (2004 1).

මිශ්‍ර සිංහල හෝඩියේ අක්ෂර ගණන පනස් හතරකැයි දක්වන කතුවරයා 'ඹ, ඳ, ඬ, ඟ' එකතු කළ විට ඒ ප්‍රමාණය පනස් අටක් වන බවත්, 'ෟ' ද ව්‍යවහාරයේ වන බව අතිරේක දැක්වීම් වශයෙන් පෙන්වා දී තිබේ (2004; 2). ශුද්ධ සිංහල හෝඩිය පිළිබඳ කරුණු දැක්වීමේ දී ස්වර සඳහා පණකුර, ප්‍රාණාක්ෂර, ව්‍යංජන වෙනුවෙන් ගතකුරු, ගාත්‍රාක්ෂර ද යන්න **සිදත්සඟරාවේ** ඇතුළත් ව ඇතැයි පෙන්වා දෙමින් **සිදත්සඟරා** අක්ෂර මාලාව ද සම්මතකරණය කොට ඇත්තේ ශුද්ධ සිංහල හෝඩිය ලෙසයි.

මිශ්‍ර සිංහල අක්ෂර මාලාව පිළිබඳ දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කොට ඇත්තේ ස්වර (සරල ස්වර, ස්වරක, සංයුක්ත) ව්‍යංජන උච්චාරණ ස්ථාන, පිළිබඳ ව ද කරුණු පැහැදිලි කරමිනි. අල්පප්‍රාණ, මහාප්‍රාණ, ඝෝෂ, අඝෝෂ, අනුනාසිකීකරණය පිළිබඳ ව ද පැහැදිලි කරන කතුවරයා ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කොට ඇත්තේ කාලීන දුහුනන්ට ව්‍යාකරණ රීති පහසුවෙන් අවබෝධ කොටගෙන මේ ව්‍යාකරණ ග්‍රන්ථයෙන් ප්‍රයෝජන ලැබීම සඳහා විය යුතුය. අනුස්වාර හා විසර්ග, වර්ගාක්ෂර, හල් කිරීම, ස්වර පිල්ලම්වල යෙදීම් පිළිබඳ ව ද කරුණු ඉදිරිපත් කර බැඳි අකුරු, ද්විත්ව සහ විෂම ව්‍යංජන සංයුක්ත අක්ෂර පිළිබඳ ව ද නිදර්ශන ඇසුරෙන් ම කරුණු දක්වා තිබේ. ව්‍යවහාර සිංහල හෝඩියේ භාවිත ශබ්ද වර්ග ද පෙන්වා දෙමින් ඇ්‍යා, ඈ්‍ය යන ස්වර දෙක ද ව්‍යවහාර සිංහලයට ඇතුළු කොටගත යුතු බවට නිර්දේශ කර ඇත. ව්‍යවහාර සිංහල හෝඩිය සමඟ ශුද්ධ සිංහල හෝඩියත්, මිශ්‍ර සිංහල හෝඩියත් සංසන්දනය කරන කතුවරයා හෝඩි තුනේ විශේෂතා පෙන්වා දී තිබේ. ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂයත්, සිංහල ශබ්දකෝෂයත් අකාරාදි පිළිවෙළ සැකසීමේ දී යොදාගෙන තිබේ. **සිදත්සඟරාවේ** සන් ලෙස අක්ෂර මාලාව දක්වා තිබුණ ද



මේ කෘතියේ නම් කොට ඇත්තේ **අමිශ්‍ර සිංහල වර්ණ මාලාව** ලෙසයි (2004; 1-7).

කරුණාතිලකයන් සංඥා යටතේ වර්ණ/අක්ෂර සහ මාත්‍රා යනු කුමක්දැයි පැහැදිලි කරමින් **සිදත්සඟරා** කතුවරයාගේ විමසුමට ද හසු ව ඇති ලෝපය (ලොප්), ආදේශය (අදෙස්), ආගම (අගම්), පූර්ව රූප (පෙර රූ), පරරූප (පර රූ), ද්විත්ව රූප (දෙරූ) පිළිබඳවත් එසේ ම ස්වර්ණ ශබ්ද, ස්වර පූර්වීකරණයත්, ධාතු ශබ්ද, ප්‍රත්‍යය, ප්‍රකෘති සම්බන්ධයෙනුත් කරුණු ඉදිරිපත් කොට තිබේ. ඒ අතර වරනැගීම්, අව්‍යය, භාෂා රූපය, පද සහ වචන, පදාදි, පදාන්ත, පද මධ්‍ය සහ උපන්ත ස්වරාදි (හාදි, ස්වරාන්ත; හලන්ත) පූර්ව ස්වරය, පර ස්වරය, විෂම ශබ්දය, සමීකරණය, නිරුක්ති (තද්භව (තබව), තත්සම (තසම), නිෂ්පන්න (නිපන්) පිළිබඳ ව කරුණු ගෙනහැර දක්වා ඇත්තේ කාලීන භාෂා ව්‍යවහාරයේ භාවිත යෙදුම් නිදර්ශන ලෙස උපයෝගී කොටගෙනයි. **සිදත්සඟරාවේ** සන් යටතේ අක්ෂර මාලාව දැක්වීමෙන් පසුව සඳි, ලිඞ්ග, විභක්ති, සමාස, ප්‍රත්‍යය, ක්‍රියා ද සංඥාධිකාරයට සංක්ෂිප්ත ව ඇතුළු කොට තිබුණ ද (**සිවිස**, 1902: 11-21) මේ ග්‍රන්ථයේ වෙනම පරිච්ඡේද යටතේ කරුණු දක්වෙන ව්‍යාකරණ ප්‍රයෝග සංඥාධිකාරයට ඇතුළු කොට නැත.

**සිදත්සඟරාවේ** ලොප්, අදෙස්, අගම්, පෙර රූ, අර්ථකථනයේ ඌනතා හඳුනාගෙන ඒවා සම්පූර්ණ කරමින් මේ ව්‍යාකරණ ප්‍රයෝග පැහැදිලි කොට ඇත්තේ **සිදත්සඟරා** ව්‍යාකරණ රීති සූත්‍රත්, උදාහරණත් ඇතුළු කරමින් **සිදත්සඟරා** ව්‍යාකරණ රීතීන්ට සම්මතයක් ද ගොඩනඟමිනි (**සිවිස**, 1902: 21-24, 2004: 21-23). **සිදත්සඟරාව** හා තුලනාත්මක අධ්‍යයනයකට හසු කිරීමේ දී **සිදත්සඟරාවේ** විග්‍රහයන් පැහැදිලි කරමින්, අඩුපාඩු යැයි හඳුනාගත් රීති සකස් කරමින් **සිදත්සඟරා** ඉදිරිපත් කිරීම්වලට විධිමත් බවක් මේ ග්‍රන්ථයේ දී එක් කොට තිබෙන බව සඳහන් කළ හැකිය.

**සිදත්සඟරා** (ආදේශ)

'වණක්හු ලොපා වණක්හු කිරීම් අදෙස් නම් ...' (**සිවිස**, 1902: 22).

**සිංහල භාෂා ව්‍යාකරණය** (ආදේශය (අදෙස්)

යම් ව්‍යාකරණමය ප්‍රකරණ තුළ වාක්‍යයක කොටසක් හෝ වචනයක කොටසක් හෝ අකුරක් හෝ වෙනුවට වෙනත් කොටසක් හෝ අකුරක් යෙදීම ආදේශ නම් වේ (2004: 22).

**සිදත්සඟරා** කතුවරයා වෘද්ධි විධිය, මාත්‍රා හානි විධිය, නිපාත, අවිද්‍යමාන විධිය, ජාත්‍යාදි පඤ්චකය හා අන්වර්ථාදි, හකාර විනිශ්චය පිළිබඳ ව සංඥා අධිකාරයේ දි කරුණු ඉදිරිපත් කළ ද මහාචාර්ය කරුණාතිලක මේ රීති ඊට ඇතුළත් නොකරයි. නමුත් **සිදත්සඟරාවේ** ඇතුළු ව නැති පරරූපය පැහැදිලි කොට ඇත. ඒ අතර කාලීන ව්‍යවහාර භාෂාව ඇසුරෙන් හඳුනාගෙන ඉදිරිපත් කළයුතු යැයි පෙනී ගිය ඇතැම් ව්‍යාකරණ ප්‍රයෝග පිළිබඳ ව සංක්ෂිප්ත ව කරුණු ඉදිරිපත් කොට ඇත. ස්වර පූර්වීකරණය, වරනැගීම, අව්‍ය (අව්‍ය), භාෂා රූපය, පද සහ වචන විග්‍රහය, පදාදි, පදාන්ත පද සහ උපාන්ත, ස්වරාදි, හලාදි, ස්වරාන්ත, හලන්ත, විෂම ශබ්ද, සමීකරණය යටතේ දක්වා ඇති කරුණු මීට නිදසුන්ය (2004: 23-29).

කරුණාතිලකයන් 'ධාතු, ශබ්ද, ප්‍රත්‍යය, ප්‍රකෘති විග්‍රහයත් නිරුක්ති තද්භව (තබව), තත්සම (තසම), නිෂ්පන්න (නිපන්) (2004: 25-26, 29) විභාගය **සිදත්සඟරා** කතුවරයාගේ සිද්ධාන්තවල ඌනතා මගහරිමින් සරල ව ඒ ඒ රීතීන් හඳුන්වා දුන්න ද පසු ව නැවතත් **සිදත්සඟරා** දැක්වීම් ම ඉදිරිපත් කරමින් **සිදත්සඟරා** ප්‍රයෝග ද සම්මතකරණය කොට තිබේ. '**ප්‍රකෘති** යනු **පියෙවි** යනුවෙන් ද, **ධාතු ප්‍රකෘති 'දා පියෙවි'** යනුවෙන් ද, **ශබ්ද ප්‍රකෘති 'සද පියෙවි'** යනුවෙන් ද **සිදත්සඟරාවේ** හැඳින්වේ. ප්‍රත්‍යය, මූලික වශයෙන් කොටස් දෙකකි. **පද සාධන ප්‍රත්‍යය හා විභජන ප්‍රත්‍යය** යනුවෙනි.

**සිදත්සඟරා** කතුවරයා ධාතුවකින් හෝ නාමයකින් පර ව යොදන්නේ ප්‍රත්‍යය ලෙස දක්වා ඇත (**සිව්ස**, 1902: 19). කරුණාතිලකයන් 'ධාතුවකට හෝ ශබ්දයකට ව්‍යාකරණමය ආදි වූ අර්ථ ගැන්වීම සඳහා එම ධාතුවෙන් හෝ ශබ්දයෙන් පරව එයට එකතු වන අවම අර්ථවත් කොටස් **ප්‍රත්‍යය** නමි' (2004: 25) වශයෙන් අර්ථමය මෙන් ම රූපමය විග්‍රහයකට ප්‍රත්‍යය ප්‍රයෝගය හසු කොට භාවිත වන ආකාරය පාදක කොටගෙන වර්ගීකරණයකට ද හසු කොට තිබේ (2004: 25).

කරුණාතිලකයන්ගේ සන්ධි විග්‍රහය ප්‍රධාන කරුණු තුනක් මුල්කරගෙන විමර්ශනය කළ හැකිය. ඒ **ස්වාධීන අර්ථකථනය හා**



**විග්‍රහය, සිදත්සඟරා කතුවරයාගේ දැක්වීම් සම්මතකරණය හා මිශ්‍ර සිංහල සන්ධි විධි නිර්දේශීකරණයයි.** සන්ධි යන්නට කරන විග්‍රහයේ විශේෂත්වය වන්නේ වාක්‍ය හා වචන යොදාගෙන 'සන්ධි' පිළිබඳ පූර්ණ අර්ථකථනයක් දැක්වීමට උත්සාහ ගෙන තිබීමයි.

වාක්‍යයක් තුළ වචන දෙකක් අනුපිළිවෙළින් යෙදීමේ දී හෝ වචනයක් තුළ ප්‍රකෘති-ප්‍රත්‍යය ආදිය අනුපිළිවෙළින් යෙදීමේ දී හෝ එකී රූපවල **සීමාවලට** එනම් **අන්තයට** (අගට) හෝ **ආදියට** (මුලට) බලපාන උච්චාරණමය වෙනස්වීම් **සන්ධි** නම්වේ. එනම් මෙබඳු සම්බන්ධයකදී පළමු පදයේ අගට හෝ දෙවන පදයේ මුලට හෝ ඒ දෙකටම හෝ යම් උච්චාරණමය වෙනසක් බලපා නම් එය **සන්ධි** ය. ලේඛනයේ දී මේවා දැක්වෙන්නේ එකී අවස්ථාවෙහි පිහිටි **අකුරුවලට** බලපාන වෙනස්කම් ලෙස ය (2004: 30).

**සිදත්සඟරාවේ** ඇතුළත් වන්නේ වඩාත් සංක්ෂිප්ත වූ නමුත් මූලික ව්‍යාකරණ සිද්ධාන්තයයි. මෙහි දී එහි අඩුපාඩු ද යටපත් කරමින් 'සන්ධි' ප්‍රයෝගයේ ස්වරූපය හඳුනාගත හැකි ප්‍රාමාණික විග්‍රහයක් ඉදිරිපත් වෙයි. **සිදත්සඟරා** කතුවරයා සන්ධි විග්‍රහයේ දී විසන්ධි ප්‍රයෝගය පිළිබඳ කරුණු ඉදිරිපත් නොකළ ද කරුණාතිලකයන් එය අනිවාර්ය වූ දැක්වීමක් ලෙස අර්ථකථනය කොට තිබේ. '... **සන්ධි සඳහා අනිවාර්ය අවශ්‍යතාවකි.** නො එසේ නම් සිදු වන ශබ්ද (උච්චාරණයේ දී) හෝ **අකුරුවල** (ලේඛනයේ දී) වෙනස්වීම් **සන්ධි** නම් ව්‍යාකරණ මාතෘකාවට අයත් නොවෙයි.' (2004: 30) සන්ධිවල මූලික ප්‍රභේදයන් දෙකක් හඳුන්වා දෙමින්;

> 'වාක්‍යයක් තුළ වචන අනුපිළිවෙළ ගැළපීමේ දී එම වචන සීමාවල පවතින ශබ්දවලට බලපාන සන්ධි හා සංකීර්ණ වචනයක් තුළ ප්‍රකෘති-ප්‍රත්‍යය ආදි වශයෙන් පද අනුපිළිවෙළ ගැළපීමේ දී එම පද සීමාවල පවතින ශබ්දවලට බලපාන සන්ධි යනුවෙන් සන්ධි පිළිබඳ මූලික ප්‍රභේද දෙකකි. මින් පළමු වැන්න **බාහිර සන්ධි** යනුවෙන් ද දෙවැන්න **අභ්‍යන්තර සන්ධි** යනුවෙන් ද හැඳින්වෙයි... (2004: 30-31).

බාහිර හා අභ්‍යන්තර වශයෙන් සන්ධි ප්‍රභේද දක්වන කතුවරයා ව්‍යවහාර වචන ආශ්‍රයෙන් ඒ ඒ සන්ධිවල අනන්‍ය ලක්ෂණ වෙන් කොට පෙන්වා දෙයි. ඒ ඇසුරෙන් තහවුරු කරන්නේ සිංහල භාෂාවේ සන්ධි රීති විග්‍රහයේ දී පූර්ව ද්විත්ව ප්‍රයෝග වැදගත් වන බවයි.

**සිදත්සඟරා** කතුවරයා සන්ධි අනුප්‍රභේද නවයක් ඉදිරිපත් කළ ද සන්ධි රීතියේ දී වෙනස් වීමට ලක්වන ශබ්ද මුල්කරගෙන කරුණාතිලකයන් සිංහල භාෂාවේ සන්ධි අනුප්‍රභේද තුනකින් ඉදිරිපත් කරයි. ඒ ස්වර, ව්‍යංජන හා මිශ්‍ර සන්ධි ය (2004: 31-32). උදාහරණ ඇසුරෙන් මේ සන්ධිවල භාවිත ස්වරූපය පෙන්වන කතුවරයා **සිදත්සඟරාවේ** සන්ධි සිද්ධි 'වණලොප් අදෙස් ඈ එහි' (**සිව්ස**, 1902: 50) 'සන්ධි සිද්ධි' යටතේ සම්මතකරණය කොට ඇත්තේ මෙසේ ය. 'සන්ධි වීමේදී ශබ්දවලට බලපාන **වෙනස** හැඳින්වීම සඳහා **සන්ධි සිද්ධි** යන සංඥාව යෙදෙයි. **ලෝප, ආදේශ, ආගම** ආදිය නිදසුන්ය' (2004: 32).

සන්ධි විග්‍රහයෙන් පසු ව **සිදත්සඟරා** කතුවරයාගේ දැක්වීම් (සන්ධි අර්ථකථනය හා උදාහරණ) පැහැදිලි කරමින් සම්මතකරණයට හසු කරන කරුණාතිලකයන් **සිදත්සඟරාවේ** දක්වා ඇති නිදර්ශනවලට අමතරව කාලීන ව්‍යවහාරයෙන් ඒ ඒ සන්ධි සඳහා උදාහරණ දක්වා ඇත. ඇතැම් විට **සිදත්සඟරා** ඉදිරිපත් කිරීම්වල ව්‍යාකූලතාවක් ඉස්මතු වන විට දී එවැනි ප්‍රයෝග සරලව, විස්තර සහිත ව පැහැදිලි කිරීමෙන් ද පෙනී යන්නේ **සිදත්සඟරා** සන්ධි විධි නවයට ලැබී තිබූ පොදු අධිකාරිත්වයයි. පරස්වර ලෝප සන්ධියට **සිදත්සඟරා** කතුවරයා විග්‍රහ වාක්‍යයක් ඉදිරිපත්කොට නැති අතර නිදසුන් ඇසුරෙන් වටහා ගැනීමට ඉඩකඩ සලසා ඇත. ඒ සම්බන්ධයෙන් කරුණාතිලකයන්ගේ අදහස මේ සඳහා නිදසුනකි. 'පූර්ව ස්වරය හා පරස්වරය සමාන වී තිබිය දී ස්වර ලෝපයක් ඇති කල්හි ලෝපයට පත්වන්නේ පරස්වරය බව සැලකීම සම්මතය වී ඇති බව පෙනේ' (2004: 35).

මිශ්‍ර සිංහල ව්‍යවහාරය මුල්කොටගෙන 'මිශ්‍ර සිංහල සන්ධි විධි' දක්වන කතුවරයා ස්වර, ව්‍යංජන හා විසර්ගය ලෙස භේද තුනක් දක්වා එහි අනුප්‍රභේද ද ඉදිරිපත් කරමින් ඒ ඒ සන්ධිවල ස්වරූපය අර්ථකථනය කොට නිදර්ශනාශ්‍රයෙන් ද පැහැදිලි කොට තිබේ (2004: 43-49).

**සිදත්සඟරාවේ** සන්ධි නිර්දේශිතය හා කරුණාතිලකයන්ගේ සන්ධි විමර්ශනය විමසීමේ දී **සිදත්සඟරා** දැක්වීම්වල ඌනතා ඉදිරිපත් නොකරන කතුවරයා ඒ සන්ධි සරලව පැහැදිලි කරමින් ව්‍යවහාර භාෂාවෙන් නිදර්ශන ද දක්වමින් ඒ සන්ධි විග්‍රහය සම්මතකරණයට හසු කොට ඇතැයි කිව හැකිය. ඒ අතර වැදගත් වන්නේ නූතන



සමාජ අවශ්‍යතා මුල්කරගෙන සැපයුණ ව්‍යාකරණ කෘතියක් වශයෙන් දහතුන්වන සියවසේ **සිදත්සඟරාවේ** නිර්දේශිත රාමුවට හසු නොවී කාලීන වශයෙන් සුදුසු ආකාරයට සන්ධි ප්‍රයෝගය හඳුන්වා දීමයි.

**සිදත්සඟරා** කතුවරයා ඡේක ප්‍රයෝග, ව්‍යවහාරාශ්‍රයෙන් හඳුනාගත් ව්‍යාකරණ සංස්ථිතිය විවිධ මාතෘකා ඔස්සේ ඉදිරිපත් කළේය. පසුකාලීන ව්‍යාකරණඥයන්, භාෂා තත්ත්වඥයන් මෙන් ම වාග්වේදීහු **සිදත්සඟරාවේ** ව්‍යාකරණ ප්‍රයෝගත්, කාලීන භාෂාව ඇසුරෙන් හඳුනාගත් රීතීනුත් යොදාගෙන සිංහල භාෂාවේ ව්‍යාකරණ සංස්ථිතියට විධිමත් බවක් ගොඩනැඟූහ. කරුණාතිලකයන්ගේ '**සිංහල භාෂා ව්‍යාකරණය**' කෘතිය ද ඊට අයත්ය.

**සිදත්සඟරාවේ** ලිඞ්ග හා විභක්ති ප්‍රයෝග විග්‍රහයට වෙනම අධිකාර දෙකක් වෙන් කොට තිබුණ ද මේ කෘතියේ හතරවන පරිච්ඡේදයේ 'නාම පද' යටතේ ලිඞ්ග භේදය, විභක්ති භේදය ඇතුළුව වචන හා නියත, අනියත භේද පිළිබඳ රීති විශ්ලේෂණය කොට තිබේ. නාම පදය කුමක්දැයි නිදර්ශන ඇසුරෙන් පෙන්වා දෙන කතුවරයා නාම පද වර්ගීකරණයකට හසුකොට ඇත (සංස්ථිතික, අන්තය, ප්‍රයෝගාර්ථ). එහි අනුප්‍රභේද ද ඉදිරිපත් කරන කතුවරයා නිදර්ශන ඇසුරෙන් පැහැදිලි කර තිබේ. **සිදත්සඟරා** කතුවරයා විවිධ ප්‍රයෝග යටතේ ඒ ඒ ස්ථානවල දී නාම පද විමර්ශනයට හසුකොට ගත්තේ වුව ද මෙවැනි වර්ගීකරණයකට එළැඹ නොමැත. කරුණාතිලකයන්ගේ මේ වර්ගීකරණයන් සමකාලීන අනෙකුත් ව්‍යාකරණ ග්‍රන්ථ ද යොදාගෙන විමසීමේ දී භාවිත නාමවල ද වෙනසක් වෙයි (2004: 50-52).

**සිදත්සඟරාවේ** 'සකුසත් අනුසෙරෙන් ඇත ද සදනට ලිඟුබේ, නො පැනේ වහරවෙසෙසෙක් - පුමඉතිරි ලිඟුදෙක විනා' (**සිව්ස**, 1902: 58) ව්‍යවහාරාශ්‍රයෙන් ලිංග දෙකක් නිර්දේශීකරණය කළ ද අනෙකුත් ඇතැම් ව්‍යාකරණ ප්‍රයෝග සේ මෙය සම්මතකරණය නොකළ කරුණාතිලක කාලීන ව්‍යවහාරය විමසා සමකාලීන භාෂාව ආශ්‍රයෙන් ලිංග ප්‍රයෝගය ඉදිරිපත් කළේය. එහි දී **සිදත්සඟරා** දැක්වීම් ඉදිරිපත් නොකළේය.

ව්‍යාකරණයෙහි දී **ලිඞ්ග භේදය** යනු ආශ්‍රිත වචනවල හැසිරීම් කෙරෙහි විද්‍යමාන වන **නාමපද** සම්බන්ධ වර්ගීකරණයයි. මෙම

වර්ග වීම, ප්‍රස්තුත භාෂාවෙහි සියලුම නාම කෙරෙහි බලපෑ යුතුය. අතරින් පතරක විනා එක් නාමයක් වර්ග කිහිපයකට ඇතුළත් වීමේ ලක්‍ෂණය (වර්ගච්ඡේදනය) බහුලව නො පැවැතිය යුතු ය. **වාක්‍ය සංස්ථිතිය** මුල් කර ගත් විට **අධිකරණය** (එනම් නාම පදයක් සමඟ වාක්‍යයෙහි යෙදෙන වෙනත් පදයක ගැළපීම) හා **ආදේශය** (එනම් නාම පදයක් වෙනුවට යෙදෙන සර්ව නාම) යන අවස්ථාවලින් ද **වචන සංස්ථිතිය** මුල් කර ගත් විට නාම පදවල **රූප සාධනය** හා **වරනැගීම** යන අවස්ථාවලින් ද **ලිඞ්ග භේදය** නමැති ව්‍යාකරණ ලක්‍ෂණය අනාවරණය වෙයි. මෙම ලක්‍ෂණ එක් එක් භාෂාව අනුව විමසිය යුතු වෙයි. (2004: 52)

අනතුරුව කරුණාතිලකයන් ව්‍යවහාර සිංහලය ඇසුරින් 'නාම පද' ලිඞ්ග භේදය පදනම් කොට විවිධ නව වචන ආශ්‍රිතයෙන් විග්‍රහයට හසුකොට ඇත (2004: 52-54). ප්‍රාණවාචී හා අප්‍රාණවාචී ලෙස ප්‍රධාන වශයෙන් ලිඞ්ග දෙකක් දක්වා ප්‍රාණවාචී ලිංග ස්ත්‍රී හා පුරුෂ ලිංග සේ වර්ග කොට වචන හා කාල භේදය කෙරෙහි ද අවධානය යොමු කොට උදාහරණවලින් පැහැදිලි කොට තිබේ. 'ස්ත්‍රී ලිංග ශබ්ද සාධනය' **සිදත්සඟරා** දැක්වීම්වලට සමීපත්වයක් උසුලයි (**සිවිස**, 1902: 59) (2004: 55). බොහෝ නාම පදයන් පුරුෂ - ස්ත්‍රීවාචී රූප ප්‍රකෘති වශයෙන් ම වෙනස් ව පවතින බව දක්වන කතුවරයා ශබ්ද ප්‍රකෘතිය වෙනසකට ලක්කොට ස්ත්‍රී ලිංගවාචී රූප සෑදෙන ප්‍රධාන ක්‍රම තුනක් දක්වා තිබේ. ඒ ස්ත්‍රී ප්‍රත්‍යය යෙදීම, ස්වර පූර්වීකරණය (අනම්‍යකරණය) හා ස්ත්‍රී ලිංගවාචී ප්‍රකෘතියක් යෙදීම වශයෙනි (2004: 55). **සිදත්සඟරා** කතුවරයා ද ඉ, ඊ වැනි ප්‍රත්‍ය ඇසුරින් ස්ත්‍රී ලිංග ශබ්ද සාධනය සඳහා නිදර්ශන ඉදිරිපත් කර ඇති අතර කරුණාතිලකයන් ද එවැනි ප්‍රත්‍ය ගැන්වී ස්ත්‍රී ලිංග පද ද සැකසෙන අයුරු පැහැදිලි කොට ඇත්තේ කාලීන ව්‍යවහාර වචන ඇසුරෙන්ය. **සිදත්සඟරා** කතුවරයා අර්ථ ක්‍රියා, ගුණවාචී හෝ පුරුෂවාචී ශබ්ද ඇසුරෙන් ස්ත්‍රී ලිංග පද සැකසෙන අයුරු උදාහරණ මඟින් පෙන්වා දී තිබේ (**සිවිස**, 1902: 62-64).

ස්වර පූර්වීකරණය, කෘදන්ත, තද්ධිත, නාම හා විශේෂණ පදවලින් (ඊ, ඉනි, ඉන) ස්ත්‍රී ලිංග පද සැකසෙන අයුරු වෙන වෙන ම පෙන්වා දෙන කතුවරයා ස්ත්‍රීවාචී ප්‍රකෘති යෙදීමෙන් ස්ත්‍රී පද සැකසෙන අයුරු නිදර්ශන ඇසුරෙන් ඉදිරිපත් කොට සංස්කෘත



භාෂාවේ බලපෑම හේතුවෙන් මිශ්‍ර සිංහලයෙන් හඳුනාගත හැකි වූ 'ස්ත්‍රී ලිංග සාධන විධි' කිහිපයක් ද පෙන්වා දී තිබේ (2004: 55-59). ඊට අමතර ව -ඉන්නී, -නී, ඉච්චී, -ඉස්සී ස්ත්‍රී ප්‍රත්‍ය ඇසුරෙන් ස්ත්‍රී ලිංග පද සැකසෙන අයුරු පෙන්වා දෙන කරුණාතිලක ප්‍රාණවාචීකරණය හා පොදු ලිංග යටතේ ද සිංහල භාෂාවේ ලිංග යෙදීම් විමර්ශනය කොට තිබේ (2004: 59-60). **සිදත්සඟරාව** හා සැලකීමේ දී **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ ලිංග දැක්වීමේ යම් යම් සමානකම් හඳුනාගත හැකි වුවත් විග්‍රහාත්මක අර්ථකථනය, නිදර්ශන සැපයීම, ස්ත්‍රී ලිංග පද සාධනයේ දැක්වීම්වල අසමානතා ද වෙයි. මේ නිසා කරුණාතිලකයන් ලිංග විභාගයේ දී **සිදත්සඟරාවේ** ලිංග නිරූපණය සම්මත කොට නැති අතර ඒ පිළිබඳ ව සඳහන් කිරීම ද බැහැර කොට තිබේ (2004: 52-60). වචන භේදය, නියත, අනියත භේදය, නාම පද ආශ්‍රයෙන් පෙන්වා දෙන කතුවරයා විභක්ති රීති දැක්වීමට ද ඉඩකඩ සලසාගෙන ඇත්තේ ද නාම පද යටතේය (2004: 60-62).

**සිදත්සඟරා** කතුවරයා 'නමින් පර වැ බෙදනු ලබනුයේ විබත් නම්' වශයෙන් විභක්ති හඳුන්වා දෙමින් එහි මුල් ස්වරූපය පෙන්වා දී ඇත්තේ 'සදහු දෙවැදෑරුම් - සරඅත් හලත් වෙසෙසින්, බුහුසූ සියලු විබතේ - එ දෙක සියරූ නො පියා' (**සිවිස**, 1902: 13, 69) සිංහල භාෂාවේ ස්වරාන්ත හා හලන්ත භේදය නාම පදවලින් හඳුනාගත හැකි අතර විභක්ති ප්‍රත්‍යය ගැන්වුව ද සිංහල භාෂාවේ මේ නාම පද බොහෝ විට මුල් ස්වරූපයෙන්ම පවතින්නේ යැයි **සිදත්සඟරා** කතුවරයා 'විභක්ති' රීතිය පැහැදිලි කළ ද ඊට වඩා ස්වාධීනත්වයකින් යුතුව කරුණාතිලකයන් 'විභක්ති' විග්‍රහය ඉදිරිපත් කොට තිබේ.

මූලිකව, ක්‍රියාපද - ආශ්‍රයයෙන් විවිධ වාක්‍ය යෙදුම්වලට යොමු වන පරිදි නාමයක රූපයට ප්‍රත්‍යය යෙදීම් ආදි වශයෙන් බලපාන වෙනස්කම් හෙවත් නාමයෙහි වරනැඟුණු රූප **විභක්ති** යනුවෙන් අදහස් වෙයි (2004: 62).

කාලීන ව්‍යවහාරයෙන් සරල වැකි තුනක් ගෙන බල්ලා, බල්ලාව, බල්ලාට යන රූප තුන මුල්කරගෙන එහි වෙනස්වීම් මත පැහැදිලි කරන්නේ භාවිත වාක්‍යවල ක්‍රියා පද සමඟ ඒ නාමවල ඇති විවිධ සම්බන්ධතා/යෙදුම් මුල් වී ඇති බවකි. සෑම වෙනස්

රූපයක් ම වෙනස් **විභක්තියක්** බවට පත්වන බව දක්වන කතුවරයා එහි ස්වරූපය ද පැහැදිලි කොට තිබේ (2004: 63).

විභක්ති නාම යටතේ 'සිංහල ව්‍යාකරණ සම්ප්‍රදායයෙහි යෙදෙන **විභක්ති නාම** මෙසේය' (2004: 63). සඳහන් කරමින් ඉදිරිපත් කොට ඇත්තේ **සිදත්සඟරාවේ** නව විධි වූ විභක්තීන්ය. **සිදත්සඟරා** කතුවරයා භාවිත නාමයන් කරුණාතිලකයන් ද යොදා තිබේ (2004: 63). මේ නව විධි විභක්ති විග්‍රහය **සිදත්සඟරා** විභක්ති අර්ථකථනයට සමීපත්වයක් දරයි (2004: 63). අනතුරුව විභක්ති ප්‍රත්‍යය දක්වා ඇත්තේ කාලීන ව භාවිත වචන යොදා ගනිමිනි (2004: 64-76). නමුත් **සිදත්සඟරාවේ** ඇතුළත් නව විධි වූ විභක්ති විග්‍රහයක් **සිංහල භාෂා ව්‍යාකරණය** ග්‍රන්ථයෙන් විග්‍රහ වී ඇති අතර එහි ඊට නොවෙනස් ආකාරයට විභක්ති හැඳින්වීම හා විග්‍රහය සිදුව තිබේ. විභක්ති ප්‍රත්‍යය දැක්වීම, ලිංගත්‍රය, වචනද්වය අරබයා සිදු ව තිබේ. භාවිත නිදර්ශන පොදු ව්‍යවහාරාශ්‍රයෙන් දැක් වූ ඒවා ය. භාවිත ඇතැම් ප්‍රත්‍ය **සිදත්සඟරාවේ** ද වෙයි (**සිවිස**, 1902: 63-68). ඇතැම් විභක්ති පද ප්‍රත්‍ය නොගන්නා ආකාරය ද පෙන්වා දී තිබීම (2004: 65-67) මේ කෘතියේ විශේෂත්වයකි. විභක්ති නවයෙන් ඇතැම් විභක්තිවල විශේෂතා ද පෙන්වා දෙන කතුවරයා (2004: 65, 67, 68) ඒ අතර විභක්ත්‍යර්ථ, නිපාත යෙදීම්, උක්ත අනුක්ත විභක්ති, ගෞරවාර්ථ රූප (2004: 69-76) පිළිබඳ ව ද සිංහල භාෂා ව්‍යාකරණ කෘතියේ ඇතුළත්ය. නාම පද වරනැඟීම ද මේ කෘතියට යොදා තිබුණ ද (2004: 76-118) **සිදත්සඟරාවේ** එවැන්නක් ඇතුළු ව නැත. **සිදත්සඟරාවේ** ඇතුළත් නව වැදැරුම් විභක්ති හා විභක්ති නාමයන් සිංහල භාෂා ව්‍යාකරණය කෘතියෙන් සම්මතකරණය වුව ද විග්‍රහයේ, විවිධතා දැක්වීම් හා නිදර්ශනවල ඇත්තේ කෘති දෙකේ ම විවිධත්වයකි. කරුණාතිලකයන්ගේ විභක්ති විග්‍රහය කාලීන ව්‍යවහාරය ඇසුරෙන් කරන ලද **සිදත්සඟරා** නවීකරණයකි.

**සිදත්සඟරාවේ** සර්ව නාම විග්‍රහයට වෙන ම පරිච්ඡේදයක් වෙන් කොට නැති වුවත් **සිංහල භාෂා ව්‍යාකරණය** ග්‍රන්ථයේ පස්වන අධිකාරිය ඊට යටත්ය. 'සර්වනාම' යනු කුමක් දැයි කතුවරයා හඳුන්වා දී පැහැදිලි කොට ඇත්තේ මෙසේ ය.

> වාක්‍යයක නාමපදයක් වෙනුවට යෙදෙන නාමය **සර්ව නාම** යනුවෙන් හැඳින් වේ. **සර්ව නාම** යන්නෙහි වාච්‍යාර්ථය සියල්ලටම ව්‍යවහාර වන නාම යනුයි.



> සිංහලයෙහි සර්වනාම පද, නාමපදවලට වඩාත් ම සමීප වනුයේ විභක්තිවල වරනැඟීම වශයෙනි... (2004: 119).

සර්වනාම වරනැඟීමේ දී ප්‍රධාන වශයෙන් උක්ත, අනුක්ත, විභක්ති භේදය දැකිය හැකි බවත් ආලපන විභක්ති රූපයක් නැති බව ද සඳහන් කරන කතුවරයා සර්වනාමවල ඇති විවිධ ස්වරූප පෙන්වා දී තිබේ (2004: 119). සර්වනාම වර්ග දහයක් නිදර්ශන ඇසුරෙන් පැහැදිලි කොට තිබේ. (පුරුෂාර්ථ, නිර්දේශාර්ථ, ප්‍රශ්නාර්ථ, අනියමාර්ථ, ස්වාර්ථ, අන්‍යාර්ථ, සර්වාර්ථ, ප්‍රමාණාර්ථ, සමෝද්දේශාර්ථ, නිෂේධාර්ථ ඒ අතර ය (2004: 119-124). **සිදත්සඟරා** කතුවරයා මෙසේ සර්වනාම විභාගයකට පෙළඹී නැති අතර විවිධ ව්‍යාකරණ ප්‍රයෝග පැහැදිලි කිරීමේ දීත්, අර්ථකථනයේ දීත් සර්වනාම භාවිත ය. ඒ අතර ක්‍රියා විග්‍රහයේ දී සිංහල භාෂා ව්‍යාකරණය කෘතියේ පුරුෂාර්ථ සර්වනාම යටතේ දක්වා ඇති උත්තම, මධ්‍යම හා ප්‍රථම පුරුෂ **සිදත්සඟරා** කතුවරයා ක්‍රියා අධිකාරියේ දී 'අන්තමසදන්බද' අන්‍ය, ත ශබ්ද හා ම ශබ්ද සේ දක්වා ඇත්තේ (**සිවිස**, 1902: 134) ප්‍රථම, මධ්‍යම හා උත්තම පුරුෂ සඳහා ය (**සිවිස**, 1902: 132-134). කරුණාතිලකයන්ගේ සර්වනාම විග්‍රහය දීර්ඝ වූවක් වන අතර එහි දී ව්‍යවහාරයේ ඇති විවිධ වචන භාවිත ය (2004: 117-124). සර්වනාම වර්ගීකරණයෙන් පසු ව පුරුෂත්‍රයට අයත් විවිධ සර්වනාම විභක්තිවල වරනඟා ඇත (2004: 124-136). අනතුරුව ගෞරවාර්ථයේ යෙදෙන (පුරුෂත්‍රයේ) සර්වනාම ද නිදර්ශන ආශ්‍රයෙන් පෙන්වා දෙන (2004: 136) කරුණාතිලකයන් **සිදත්සඟරාවේ** භාවිත සර්වනාම පිළිබඳ ව සඳහන් කොට නැත.

**සිදත්සඟරාවට** ඇතුළු ව නැති 'සංඛ්‍යා ශබ්ද' විග්‍රහයට ද වෙනම පරිච්ඡේදයක් කරුණාතිලකයන් වෙන් කොට 'මූල සංඛ්‍යා - වාචී සිංහල ශබ්ද' රාශියක් ඉදිරිපත් කොට තිබේ (2004: 137-144). සංඛ්‍යා ශබ්ද **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ ඇතුළත් සර්වනාම විග්‍රහය **සිදත්සඟරා** කතුවරයාගේ දැක්වීමක් නොව කාලීන අවශ්‍යතා වෙනුවෙන් සකසන ලද්දක් වශයෙන් සැලකිය හැකිය. ව්‍යවහාරයේ භාවිත විවිධ වචන යොදාගෙන මේ සර්වනාම විග්‍රහය දක්වා ඇතත් සර්වනාම වර්ගීකරණය අනවශ්‍ය මෙන් ම දීර්ඝ වූවක් ලෙස ද සැලකීමට කරුණු වෙයි (2004: 118-136). 'සංඛ්‍යා ශබ්ද' විග්‍රහයට ද පෙළඹෙන කතුවරයා සිංහල හා සංස්කෘත ශබ්ද රූප ඇසුරෙන්

කරුණු ඉදිරිපත් කරයි. 'මූල සංඛ්‍යා' ශබ්ද, එහි ප්‍රභේද, 'නූතන ක්‍රමය අනුව සංඛ්‍යා හැඳින්වෙන සිංහල ශබ්ද පිළිබඳ විශේෂතා', එහි ස්වරූපය කරුණු ප්‍රකට කොට සංඛ්‍යා ශබ්ද වරනඟා දැක්වීමට ද කාලීන ව්‍යවහාරය උපයුක්ත කොටගෙන ඇත. ඒ අතර 'සංඛ්‍යා ඒකක ප්‍රකාශ' කරන ආකාරය, 'ක්‍රම සංඛ්‍යා ශබ්ද', 'සංඛ්‍යා දැක්වීම සඳහා යෙදෙන සංස්කෘත ශබ්ද' ආදි වශයෙන් විවිධ මාතෘකා ඔස්සේ භාවිත සංඛ්‍යා ඉදිරිපත් වන ආකාරය පෙන්වා දී තිබේ. ඒ සිංහල භාෂාවේ ව්‍යාකරණ සංස්ථිතියේ නවීකරණයකි.

**සිදත්සඟරාවේ** අටවන පරිච්ඡේදය වෙන් ව ඇත්තේ 'පසරුත්' ප්‍රයෝගය විග්‍රහයට ය (**සිවිස**, 1902: 165-176). හත්වන පරිච්ඡේදයේ 'කෘදන්ත හා තද්ධිත ශබ්ද' සේ නම් කොට විග්‍රහයට එළැඹ ඇත්තේ **සිංහල භාෂා ව්‍යාකරණය** ග්‍රන්ථයෙනි. **සිදත්සඟරා** කතුවරයා 'දයින් නෙමෙන් හොත - කැරැ අරුතට නිසි පසන්, සපයා සදන් පසරුත් - හිම් නොලැඟැ ලොවැ වහරන්' (**සිවිස**, 1902: 165) ලෙස ධාතුවකින්, නාමයකින් හෝ නිසි අර්ථයට සුදුසු ලෙසින් ප්‍රත්‍යය යොදා ලෝක ව්‍යවහාරයට පටහැනි නොවී ප්‍රත්‍යයාර්ථ සම්පාදනය කළහැකි යැයි ප්‍රත්‍යයවල මූලික ස්වරූපය **සිදත්සඟරා** කතුවරයා පෙන්වා දුන්න ද කරුණාතිලකයන්ගේ ප්‍රත්‍යය විග්‍රහය **සිදත්සඟරාව** හා සැලකීමේ දී හඳුනාගත හැකි වන්නේ වෙනසකි.

> ප්‍රකෘතියකට යම් ප්‍රත්‍යයක් එකතු වීමෙන් එම ප්‍රකෘතිය වාක්‍යයෙහි අනෙක් පදයකට හෝ පදවලට සම්බන්ධ වේ නම් එබඳු ප්‍රත්‍යය **වරනැඟීමේ ප්‍රත්‍යය** හෙවත් **විභජන ප්‍රත්‍යය** යනුවෙන් හැඳින්විය හැකිය,, යම් පදයක, වරනැඟීමේ ප්‍රත්‍යය ඉවත් කළ පසු තවත් ප්‍රත්‍යය ඉතිරි වේ නම් එම ප්‍රත්‍යය **පද සාධන ප්‍රත්‍යය** යනුවෙන් හැඳින්වෙයි (2004: 152).

**සිදත්සඟරා** කතුවරයා ධාතුවක් හෝ නාමයක් ප්‍රස්තුතව ප්‍රත්‍යය එකතුව වචන සැකසීමේ දී ප්‍රත්‍යයාර්ථ ශබ්දවල ස්වරූපය නිදර්ශන ඇසුරෙන් පෙන්වා දීමට උත්සාහ දරා ඇති අතර ඒ ප්‍රත්‍යයවල වරනැඟීම් ස්වරූපය මත ප්‍රත්‍යයාර්ථ ශබ්ද පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත්තේ කරුණාතිලකයන්ය (2004: 152).

**සිදත්සඟරාවේ** 'දයින් වන පස' ධාතුවෙන් වන්නා වූ ප්‍රත්‍යය ෂට්කාරකවල ද, භාවාර්ථයේ ද යෙදෙන බව දක්වා නිදර්ශන ඇසුරෙන්



පැහැදිලි කොට ඇති අතර 'කෘදන්ත ශබ්ද' නාමීකරණය කොට ඇති කරුණාතිලකයන් ද කාරකාර්ථයේ ද, භාවාර්ථයේ ද යෙදෙන ආකාරය නිදර්ශන මඟින් පෙන්වා දෙමින් වර්තමානයේ දී කර්ම, කර්තෘ හා කරණ කෘදන්ත භාවිතය වඩා පැහැදිලි ව හඳුනාගත හැකි බව පෙන්වා දී ඇත. ඒ අතර 'අරුත් කිරිය සද' යටතේ 'ඒ' කාරක ප්‍රත්‍යයත්, 'ඊ', 'ඌ' ආදි ස්ත්‍රීවාචී ප්‍රත්‍යයත් යෙදිය හැකි කෘදන්ත පදත් පෙන්වා දී තිබේ. **සිංහල භාෂා ව්‍යාකරණය** කාරකාර්ථ කෘදන්ත සඳහා දක්වා ඇති නිදර්ශන සියල්ල ම **සිදත්සඟරාවෙන්** ගත් ඒවා ය. (**සිවිස**, 1902: 166-173, 2004: 153-156). ඒ අතර **සිදත්සඟරා** කතුවරයා භාවාර්ථ කෘදන්ත සඳහා 'නු' හා 'උම්' ප්‍රත්‍යය පමණක් යෙදෙන බව දක්වා ඇතැයි සඳහන් කරන කරුණාතිලකයන් 'ඊම්', 'ඉලි' හා 'මන්' ප්‍රත්‍යය ද භාවාර්ථයේ යෙදෙන බව සඳහන් කොට ඇත්තේ කාලීන ව්‍යවහාරයෙන් නිදර්ශන ද ඉදිරිපත් කරමිනි (2004: 155).

**සිදත්සඟරාවේ** තද්ධිත විග්‍රහය ම සම්මත කරන කරුණාතිලකයන්ගේ අර්ථකථනය වන්නේ ද 'නාමයකට (හෝ නාම විශේෂණ ප්‍රකෘතියකට) පද සාධන ප්‍රත්‍යයක් යෙදීමෙන් සෑදෙන නාම ශබ්ද **තද්ධිත** ශබ්ද නමින් හැඳින්වේ.' (2004: 156) මෙහි 'නාම විශේෂණ ප්‍රකෘතියකට' සඳහන් වුව ද '...නාම ප්‍රකෘතිය හා නාම විශේෂණ ප්‍රකෘතිය අතර වෙනසක් නොමැත' (2004: 156) දැක්වීමත් සමඟ **සිදත්සඟරා** නිරූපණය සම්මතකරණයකි. '**සිදත් සඟරාවෙහි** තද්ධිත ප්‍රත්‍යය සඳහා දක්වා ඇති නිදසුන් මෙහි ප්‍රථමයෙන් දක්වනු ලැබේ' යනුවෙන් සඳහන් කරන කරුණාතිලකයන් (2004: 156) **සිදත්සඟරා** නිදර්ශන ප්‍රභේද දහහතරක් යටතේ වෙන් කොට ඉදිරිපත් කොට තිබේ (2004: 156-159). **සිදත්සඟරවේ** පසරුත් අදියර ප්‍රබල සම්මතකරණයකට හසුකරන කරුණාතිලකයන් **සිදත්සඟරාවට** ඇතුළු ව නැති නමුත් ව්‍යවහාරයේ ඇති තවත් තද්ධිත පද රාශියක් අනු ප්‍රභේද යටතේ ඉදිරිපත් කොට තිබේ (2004: 159-162). ඊට අමතර ව මිශ්‍ර සිංහල ව්‍යවහාරය සැලකිල්ලට ගෙන සංස්කෘත භාෂාවෙන් ගෙන ඇති කෘදන්ත හා තද්ධිත ප්‍රත්‍යය සහිත පද නිදර්ශන ආශ්‍රයෙන් පෙන්වා දී තිබේ (2004: 162-167). **සිදත්සඟරා** කතුවරයා පසරුත් අදියරේ දී කෘදන්ත හා තද්ධිත ලෙස ප්‍රත්‍යය නම් නොකොට ප්‍රධාන විෂයයන් දෙකකින් ඉදිරිපත් කළ ද කරුණාතිලකයන්ගේ ග්‍රන්ථය හා සැලකීමේ දී එසේ වර්ගීකරණය කිරීම හැර අනෙකුත් දැක්වීම් **සිදත්සඟරා** ඉදිරිපත් කිරීම් සම්මතකරණයකි.

'වෙසෙසුන් පෙදේ' විග්‍රහයට **සිදත්සඟරා** කතුවරයා හයවන පරිච්ඡේදය වෙන් කොට ඇති අතර **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ නාම විශේෂණ යටතේ අටවන පරිච්ඡේදය ඊට අයත්ය (**සිවිස,** 1902: 127-132, 2004: 168-172). යම් යම් කරුණුවල සමානතා විශද වුවත් මේ විග්‍රහයන් දෙකේ ම අසමානතා ද වෙයි. ඒ බව **සිදත්සඟරා** කතුවරයාගේ 'විශේෂණ විශේෂ්‍ය' විග්‍රහයත්, කරුණාතිලකයන්ගේ 'නාම විශේෂණ' විග්‍රහයත්, තුලනාත්මක අධ්‍යයනයකට හසුකිරීමේ දී හඳුනාගත හැකිය. **සිදත්සඟරාවේ** දී ප්‍රමුඛ වූ අර්ථය විශේෂ වන බවත් වර්ණනා කරන පදය විශේෂණ වන බවත් ලිඞ්ග, විභක්ති විශේෂණ පදවල දී සමාන වන බවත් සඳහන් කොට තිබේ (**සිවිස**, 1902: 127). 'නාම' වචනය පාදක ව **සිදත්සඟරාවේ** වෙසෙසුන් දැක්වීම කරුණාතිලකයන්ගේ ඉදිරිපත් කිරීම අධ්‍යයනයේ දී හඳුනාගත හැකිවන්නේ අසමානත්වයකි.

> **නාමවිශේෂණය** යනු නාමපදයකට විකාශනයක්/ විස්තරයක් වශයෙන් යෙදෙන පදයයි. එසේ විශේෂණය කරනු ලබන පදය **විශේෂ්‍යය** යනුවෙන් හැඳින්වෙයි. විශේෂ්‍ය වශයෙන් සිංහලයෙහි නාමපද මෙන් ම සර්ව නාම ද යෙදේ (2004: 169).

මෙය තව දුරටත් පැහැදිලි කරන කරුණාතිලකයන් විශේෂණ සේ නාම නාම, සර්වනාම, කෘදන්ත නාම, තද්ධිත නාම හා සංඛ්‍යා නාම ශබ්ද යෙදෙන බවත් නාම නාම අතුරින් විශේෂණත්වය සඳහා යෝග්‍ය වන්නේ ජාති, ද්‍රව්‍ය, ගුණ හා සංඥා නාම ශබ්ද බවත් නිදර්ශන මුල්කරගෙන පැහැදිලි කර තිබේ (2004: 169).

**සිදත්සඟරාවේ** තුල්‍යාධිකරණයේ දී ලිංග හා විභක්තිවල සමානත්වයත් එහි දී විශේෂණය හා විශේෂ්‍යය ගැළපීම මත තුල්‍යාධිකරණ හා භින්නාධිකරණ ලෙස වර්ග වන ආකාරයත් පෙන්වා දී තිබේ (2004: 169). තව ද තුල්‍යාධිකරණ (සමානාධිකරණ), භින්නාධිකරණ හා ප්‍රශ්නාර්ථ විශේෂණ පිළිබඳ ව වෙන වෙනම කරුණු දක්වා තිබේ (2004: 170-172). **සිදත්සඟරා** කතුවරයා ද සමානාධිකරණ විශේෂණයට, භින්නාධිකරණයේ විශේෂණයට විවිධ නිදර්ශන ඇසුරු කරමින් අර්ථකථනය කොට තිබේ. **සිදත්සඟරා** විග්‍රහය සම්මතකරණ කරුණාතිලකයන් නිදර්ශන දක්වා ඇත්තේ කාලීන භාෂාවෙනි (2004: 169-172). ඒ අතර ප්‍රශ්නාර්ථ විශේෂණ දැක්වීම (2004: 172) මේ කෘතියේ තවත් ප්‍රවණතාවකි.



**සිදත්සඟරාවේ** ක්‍රියා අර්ථකථනය දීර්ඝ වූවක් වුවත් 'ධාතුව' මුල් ව ක්‍රියාව සිදුවන බව පෙන්වා දීම සිංහල භාෂා ව්‍යාකරණය කෘතියේ ද ආදර්ශය වී ඇත. ඒ බව 'දැමුව වැ සිදු කිරිය නම්' (**සිවිස,** 1902: 20). 'වාක්‍යයක ආඛ්‍යාත ස්ථානයෙහි යෙදෙන, ධාතු මූලික වූ කේන්ද්‍රීය පදය ක්‍රියා පදයයි' (2004: 173) වශයෙන් සඳහන් කොට ඇත.

**සිදත්සඟරා** කතුවරයා ක්‍රියාධිකාරයේ දී අකර්මක සකර්මක ස්වරූපය නිදර්ශන ආශ්‍රයෙන් ප්‍රථමයෙන් පැහැදිලි කළ ද කරුණාතිලකයන් ද කාලීන ව්‍යවහාර නිදර්ශන ඇසුරෙන් මේ රීතිය පැහැදිලි කොට තිබේ (2004: 176). **සිදත්සඟරාවේ** පුරුෂත්‍රය 'අන්තමසදන්බඳ' (අන්‍ය, ත හා ම ශබ්ද) (**සිවිස,** 1902: 134) ලෙසත් කාලත්‍රය 'නිමියේ අයු, නො නිමියේ වත්මන් නො පැටියේ අනා' වශයෙන් ත්‍රෛකාලය නිර්දේශීකරණය කොට තිබේ (**සිවිස**, 1902: 134). ඒ අතර මහාචාර්ය කරුණාතිලකයන් **සිදත්සඟරා** පුරුෂත්‍රය උත්තම, මධ්‍යම හා ප්‍රථම ලෙසත් කාලත්‍රය ප්‍රධාන වශයෙන් අතීත හා අනතීත සේත් අනතීතය වර්තමාන හා අනාගත ලෙසත් වර්ග කොට දක්වනු ලැබ ඇත (2004: 173). 'බල' ධාතුව පුරුෂත්‍රය, කාලත්‍රය හා වචනද්වයේ ම වරනඟමින් සඳහන් කොට ඇත්තේ පහත ආකාරයට ය.

> මෙම වරනැඟීම් පිළිවෙළ, ව්‍යවහාර සිංහල ක්‍රියා වරනැඟීම සමඟ දැඩි ලෙස සැසඳෙයි. ව්‍යවහාර සිංහලයෙහි **කාල භේදය** සඳහා ක්‍රියා ධාතු වරනැඟීමේදී පුරුෂ, වචන භේදයක් දක්නා නො ලැබීමත්, විශේෂ අනාගත ක්‍රියා රූපයක් නොතිබීමත් එම වෙනසට හේතුවෙයි (2004: 173).

මේ ආකාරයට අනාගත කාලය ව්‍යවහාර කිරීමක් සිදුකොට තිබේ. **සිදත්සඟරාවේ** පුරුෂත්‍රය, කාලත්‍රය හා වචනද්වයේ යෙදෙන ක්‍රියා ප්‍රත්‍යය පෙන්වා උදාහරණ සැපයුවත් (**සිවිස,** 1902: 135-144) කරුණාතිලක ක්‍රියා ධාතු පිළිබඳ විග්‍රහයක යෙදී ඇත. මූල ධාතු හා සාධිත ධාතු ලෙස ක්‍රියා ධාතු වර්ගීකරණය කොට එහි අනු ප්‍රභේද ද ඉදිරිපත් කරමින් කුමාරතුංගගේ ධාතු ගණ හයට අනුගතව ක්‍රියාව වරනඟා ඇත (2004: 174-176). **සිදත්සඟරාවේ** අන්‍ය, ත හා ම ශබ්ද සර්වනාම ද භාවිත කරමින් කාලත්‍රයේ හා වචනද්වයේ භාවිත වන ආකාරය පැහැදිලි කළ ද (**සිවිස**, 1902: 144-147) කරුණාතිලකයන් කර්තෘ හා කර්ම කාරක ක්‍රියාවල ස්වරූපය පැහැදිලි කරමින් 'ධාතු

මූල ක්‍රියා ශබ්ද' ප්‍රයෝජ්‍ය, කර්මකාරක/නිරුත්සාහක/භාවකාරක ද්විත්ව ප්‍රභේද යටතේ කරුණු විශ්ලේෂණය කොට තිබේ. ප්‍රයෝජ්‍ය ක්‍රියා විභාගයේ දී **සිදත්සඟරා** දක්වීම් වන අකර්මක සකර්මක වීම ක්‍රියා ධාතුවෙන් පරව ව, ලවා ප්‍රත්‍යය, නිපාත භාවිතය ලවා ප්‍රත්‍යය රහිතව භාවිතය ඒ අතර වෙයි (**සිවිස**, 1902: 148-150. 2004: 177-178). එසේ ම ප්‍රයෝජ්‍ය ක්‍රියා ශබ්ද සැකසීමේ දී ඇතැම් ක්‍රියා ධාතුවල රූපයට සිදුවන වෙනස්කම් ද පෙන්වා දී තිබේ (2004: 177-178). කර්මකාරක ක්‍රියා විග්‍රහයේ ඇත්තේ සමීපතාවකි (**සිවිස**, 1902: 154-158). සංස්කෘත භාෂා ආශ්‍රයෙන් 'නාම මූල ක්‍රියා ශබ්ද' ස්වරූපය පැහැදිලි කරන කතුවරයා (2004: 179) නාම ධාතුක සිංහල භාෂාවේ විරල බව ද පෙන්වා දී තිබේ (2004: 180). **සිදත්සඟරා** කතුවරයා ක්‍රියා වරනැඟීමට උත්සාහ දරා නොමැති වුවත් මේ ව්‍යාකරණ ග්‍රන්ථයේ විශේෂත්වයක් වන්නේ ක්‍රියා වරනැඟීමට ප්‍රධාන ස්ථානයක් හිමි කොට දීම ය (2004: 180). සමාපක හා අසමාපක ක්‍රියා යටතේ ක්‍රියා වරනඟා ඇති අතර කාලීන භාෂා ව්‍යවහාර ආශ්‍රයෙන් ව්‍යාකරණ සංස්ථිතියේ කරන ලද ව්‍යූහාත්මක විවිධතා වශයෙන් ද මේවා අර්ථ කථනය කළ හැකිය.

ප්‍රයෝජ්‍ය ක්‍රියාව හා කර්මකාරක/නිරුත්සාහක ක්‍රියාව, සාධිත ධාතු, ධාතු මූල ක්‍රියා ශබ්ද යටතේ පැහැදිලි කරන කරුණාතිලක ත්‍රෛකාලික ක්‍රියා, විධි හා ආශිර්වාද ක්‍රියා සමාපක ක්‍රියා වරනැඟීම් යටතට අයත් කොට තිබේ (2004: 181). ත්‍රෛකාලික ක්‍රියා වර්තමාන අනාගත වරනැඟීම්, කර්මකාරක අතීත කාල වරනැඟීම් ආදි වශයෙන් විවිධ ඉදිරිපත් කිරීම් වෙයි (2004: 185-195). ආශිර්වාද ක්‍රියාව විමර්ශනය ද **සිදත්සඟරා** දක්වීම්වලට සමාන වෙයි (2004: 194-195). 'අසමාපක ක්‍රියා රූප' යටතේ කෘදන්ත (වර්තමාන, අතීත) පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා ද අසම්භාව්‍ය ක්‍රියා ද විමර්ශනය කෙරේ (2004: 195). කෘදන්ත විභාගයේ දී **සිදත්සඟරා** කතුවරයා කෘදන්ත ප්‍රත්‍යර්ථ ශබ්ද දක්වමින් නිදර්ශන ඇසුරෙන් කෘදන්ත ක්‍රියාවල ස්වරූපය හඳුනාගැනීමට සලස්වා තිබේ. අතීත, වර්තමාන කාල දෙකේ ම කෘදන්ත ක්‍රියා දක්වන කතුවරයා විශේෂ ක්‍රියා ධාතු ගෙන එහි ස්වරූප පැහැදිලි කරමින් ප්‍රධාන වශයෙන් ම කාලීන ව්‍යවහාර භාෂාව අධ්‍යයනයට හසුකොට තිබේ (2004: 165-173). පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා විමර්ශනයේ දී **සිදත්සඟරා** දක්වීම්වල ඇතුළත් ප්‍රත්‍යය



මෙහි දී ද භාවිත ය (**සිවිස**, 1902: 162, 2004: 168-200). අසම්භාව්‍ය ක්‍රියාව විමර්ශනයේ දී ද **සිදත්සඟරාවේ** දක්වීම්වලට ප්‍රබල සම්මතයක් ගොඩනඟා ඇත (2004: 200-202). ඒ අසම්භාව්‍ය ක්‍රියාව අර්ථකථනය, අනියමාර්ථ හා කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියා විග්‍රහය හා අසම්භාව්‍ය ක්‍රියා ප්‍රත්‍යය ගන්නා ආකාරය දැක්වීම්වල දී ය. ක්‍රියා රීති ව්‍යූහයේ ප්‍රතිසංස්කරණයක් ලෙස සැලකිය හැකි වන්නේ 'ප්‍රම්ජන්ත ක්‍රියා' නමින් 'ඇති, නැති, හැකි, යුතු' ක්‍රියා රූප ප්‍රකට කිරීම හා වරනැඟීම මුල්කරගෙනයි (2004: 202-203). තව ද උප පද ක්‍රියා රූප, ක්‍රියා - භාව වාචක ක්‍රියා දක්වීමත් ඒ හා සමාන වේ.

**සිදත්සඟරාවේ** ක්‍රියාධිකාරය හා **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ ක්‍රියා අධ්‍යයනයේ දී **සිදත්සඟරාවේ** පමණකුදු නොව කුමාරතුංගයන්ගේ **ක්‍රියා විවරණයේ** ද ආභාසය ගෙන කාලීන ව්‍යවහාරයට සුදුසු වන ව්‍යාකරණ සංස්ථිතියක් ගොඩනැඟීමට උත්සාහගෙන තිබීම මේ කෘතියෙන් පැහැදිලි ව හඳුනාගත හැකිය.

ක්‍රියා විශේෂණ සඳහා වෙනම පරිච්ඡේදක් ඇතුළත් කොට ඇති කරුණාතිලකයන් භාෂාවේ තවත් එක් රීතිමය රටාවක් විභාග කොට ඇත්තේ ක්‍රියාව හා ඒ හා බැඳෙන විශේෂණ පද පහදා දෙමින්ය. ප්‍රථමයෙන් ම 'ක්‍රියා පදයකට විශේෂණය වීම් වශයෙන්, ප්‍රධාන අර්ථ හතරකින් ක්‍රියා විශේෂණ යෙදෙයි.' ඒ ආකාරාර්ථ, කාලාර්ථ, ස්ථානාර්ථ, හේත්වර්ථ සේ නම් කොට පැහැදිලි කරමින්ය. (2004: 210). කාලීන සමාජ භාවිතය ද උපයෝගී කරගෙන විවිධ නිදර්ශන සපයන කතුවරයා 'සංස්ථිතිය හෙවත් ක්‍රියා විශේෂණය සෑදී ඇති ආකාරය අනුව ක්‍රියා විශේෂණ ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක' යනුවෙන් සඳහන් කරමින් ඒ ක්‍රියා විශේෂණ පද හා ක්‍රියා විශේෂණ පාද/වාක්‍යාංශ වශයෙන් හඳුන්වා ඒ පිළිබඳ ව දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කොට ඇත්තේ එහි අනු ප්‍රභේද ද දක්වමිනි (2004: 211-219).

අව්‍ය පද විභාගයේ දී උපසර්ග හා නිපාත පිළිබඳ ව වෙනම කරුණු දක්වා ඇත්තේ මේ පද භාෂාවේ භාවිත වන ආකාරය සැලකිල්ලට ගනිමිනි. 'නිපාත පද මූලික වශයෙන් ප්‍රයෝග වනුයේ වාක්‍යයක් තුළ පද අතරේ සම්බන්ධතා දක්වීමටත්, සංකීර්ණ වාක්‍ය තුළ වාක්‍යාංශ අතරේ සම්බන්ධතා දක්වීමටත්ය' (2004: 220). වාක්‍යයක ඒකාබද්ධතාව, විධිමත්භාවය, වචන අතර සම්බන්ධතාව

වැනි දේ විවිධ කරුණු සාධක ව වැදගත් වන විවිධාර්ථවල යෙදෙන්නා වූ නිපාත වර්ග කිහිපයක් දක්වමින් ඒ පිළිබඳ පැහැදිලි කරන කතුවරයා තම මතය තහවුරු කිරීමට භාවිත ව්‍යවහාරයෙන් නිදර්ශන ද ඉදිරිපත් කොට තිබේ (2004ඃ 220-226).

> ප්‍රකෘතියක (එනම් ක්‍රියා ධාතුවක හෝ නාම ශබ්දයක) අර්ථය සම්බන්ධයෙන් යම් විශේෂතාවක් ඇති වන අයුරු එකී ප්‍රකෘතියට මුලින් යෙදෙන අව්‍යය පද විශේෂය **උපසර්ග** නමින් හැඳින්වෙයි. ප්‍රකෘතියෙහි අර්ථය තීව්‍ර කිරීම/හීන කිරීම/විරුද්ධ අර්ථයක් ගෙණ දීම ආදි වශයෙන් එම අර්ථ විශේෂතාව සිදු වෙයි. ...උපසර්ග - ප්‍රකෘති යෝගයෙහි දී උපසර්ගය, ප්‍රකෘතියෙන් වෙන් නොකොට යෙදීම සම්මත සිංහල සම්ප්‍රදායයයි (2004)ඃ 226).

උපසර්ග රීතියේ ස්වරූපයත්, අර්ථයත්, භාෂාවේ භාවිත වන ස්වරූපයත් පැහැදිලි කරන කතුවරයා 'හෙළ බස සම්බන්ධයෙන් **සිදත් සඟරාවේ** පහත සඳහන් උපසර්ග 20 දක්වේ' (2004ඃ 226). සඳහන් කරමින් **සිදත්සඟරා** දක්වීම් සම්මත කොට තිබේ (2004ඃ 226-227). සිංහල භාෂාවේ උපසර්ග පද ලෙස **සිදත්සඟරා** දක්වීම් සම්මත කළ කතුවරයා පසු ව සංස්කෘත, ඍණ වචනවලින් සිංහල භාෂාවට ඇතුළු ව ඇති උපසර්ග කිහිපයක් මිශ්‍ර සිංහල ව්‍යවහාරයෙන් හෙළි කොටගෙන ඉදිරිපත් කර ඇත (2004ඃ 228).

**සිංහල භාෂා ව්‍යාකරණයේ** නාම, ක්‍රියා ආදි විවිධ ව්‍යාකරණ රීතිවල වරනැගීම්වලට විශේෂ ස්ථානයක් හිමි කොට දී ඒ ඇසුරෙන් භාෂාවේ ස්වභාවය පැහැදිලි කිරීමට උත්සාහ දරන කරුණාතිලකයන් නාම වරනැගීම්වල දී යෙදෙන්නා වූ විභක්ති මෙන් ම විභක්ති ප්‍රත්‍යය සිවුවන පරිච්ඡේදයේ දී විභාග කරන අතර ඒ විභක්ති ප්‍රත්‍යය හා විභක්ත්‍යර්ථ නිපාත සමඟ දොළොස්වන පරිච්ඡේදයේ දී ඉදිරිපත් කොට ඇත (2004ඃ 229-245). දේව ප්‍රතිරාජ අමාත්‍යවරයා පතිරජ පිරුවන්පති හිමියන්ට ආරාධනා කළේ ද ස්වකීය භාෂාවේ විභක්ති ආදි ව්‍යාකරණ රීති පළ කිරීමට ව්‍යාකරණ කෘතියක් කරන ලෙස ය (**සිව්ස**, 1902ඃ 232).

සිංහල භාෂාවේ ව්‍යාකරණ සංස්ථිතියේ විභක්ති රීතියට ප්‍රමුඛස්ථානයක් හිමිවන බව එකල සිට විද්වත් මතයේ වූ බව මෙයින් පෙනී යන අතර **සිදත්සඟරා** කතුවරයාගේ සිද්ධාන්ත සංග්‍රහයේ



දීර්ඝතම අධිකාරය බවට එය පත්වීමෙන් ද ඒ බව පැහැදිලි වෙයි. කරුණාතිලකයන් ද අදියර දෙකකින් ම විභක්ති රීතිය දක්වීමට පෙළඹීම **සිදත්සඟරා** කතුවරයාගේ තවත් මතයක් සම්මතකරණයකි. දොළොස්වන පරිච්ඡේදයේ දී නව විධි විභක්තිවල ප්‍රාණවාචී හා අප්‍රාණවාචී ඒකවචන හා බහුවචන විභක්ති ප්‍රත්‍යය දක්වන කර්තෘ පසු ව ඒ ඒ විභක්ති ප්‍රයෝග එකිනෙකින් සරලව පැහැදිලි කරමින් නිදර්ශන ඇසුරෙන් තව දුරටත් විස්තර කොට ඇත (**සිව්ස**, 1902ඃ 70-107) (2004ඃ 229-230). තව ද එක් එක් විභක්ති ප්‍රත්‍යය සඳහා ව්‍යවහාර භාෂාවෙන් ද උදාහරණ දක්වා ඇත (2004ඃ 230-245). එසේ ම විභක්ති අර්ථකථනය ද **සිදත්සඟරා** දක්වීම ම සරලව ඉදිරිපත් කිරීමකි (2004ඃ 230-231, 239). එය ස්වාධීන දක්වීමක් ලෙස ද පෙන්වා දිය හැකි වන්නේ ඇතැම් විට විභක්ති භාවිතයේ ස්වරූපය මත නිදහස් අර්ථකථන දක්වා ඇති බැවිනි (2004ඃ 230, 234, 236, 241, 242, 244, 245). **සිදත්සඟරාවේ** ඉදිරිපත් කිරීම පිළිබඳ ව සඳහන් කොට නැති වුව ද කරුණාතිලකයන් කාලීන ව්‍යවහාරයට ප්‍රධානත්වයක් දී එයින් මේ රීති දක්වීම හා නිදර්ශන සැපයීම සිදුකර ඇත.

> සංස්කෘතයෙහි **සම්**-'එකට/සමඟ' යන උපසර්ග පූර්ව වූ **අස්**-'දැමීම' යන ධාතුවෙන් සාධිත **සමාස** යන්නෙහි අර්ථය 'එකට යොදන ලද/කැටි කරන ලද' යනුයි. ව්‍යාකරණයෙහි දී මෙය සංඥාවක් වශයෙන් යෙදෙනුයේ 'නාම පදයක් මුල් කොට ගත් පද කිහිපයක් කැටි කොට/සංක්ෂේප කොට දක්වීම' සඳහායි. මෙසේ සැදුණ පද වරනැගීම් ආදියෙහි යෙදෙනුයේ **තනි ශබ්ද** ලෙසිනි (2004ඃ 246).

> නේසදන් සියො වැ එකසද අයුරක් වනසේ ගළපනු සමස් නම්... කියලත එකඅරුත - සබඳ වැ සදන් නනරුත් එ වියූ සමස්විධි නම් - එහි බේ දන් පවස්මෝ (**සිව්ස**, 1902ඃ 14, 108).

**සිදත්සඟරා** සමාස අර්ථකථනය විධිමත් ව නිරූපණය කිරීමක් ලෙස **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ සමාස අර්ථකථනය හා නාමීකරණය සඳහන් කළ හැකියි. සමාස නාමවල මූලික ලක්ෂණ පහක් පැහැදිලි කරන කතුවරයා එමඟින් තව දුරටත් සමාස විග්‍රහය අර්ථවත් කොට තිබේ. ඒ 'පද විභාගය', 'වාක්‍ය විභාගය', 'අර්ථ විභාගය',

'විග්‍රහ වාක්‍යය' වන 'ලුප්ත/අලුප්ත සමාස' දැක්වීමට අනුගතව ය (2004: 246-249). මේ එක් එක් රීතියෙන් සිංහල භාෂාවේ සමාස ප්‍රයෝගය පැහැදිලි කරන කතුවරයා **සිදත්සඟරා** දැක්වීමට ද ගොඩනඟා ඇත්තේ ප්‍රබල සම්මතයකි. **සිදත්සඟරාවේ** සමාස පිළිබඳ ව කරන්නා වූ විග්‍රහයට කරුණාතිලකයන් සම්මතය ලබා දී ඇත්තේ මෙසේ ය. 'මෙම නිර්වචන දෙකින් පළමු වැන්නෙන් සමාසයක **රූපීය ලක්ෂණ** ද, දෙවැන්නෙන් **වාච්‍යාර්ථ** හා **කාරකාර්ථාදී** වශයෙන් **අර්ථ ලක්ෂණ** ද **සිදත් සඟරා** කතුවරයා පැහැදිලි කර ඇත' (2004: 249).

**සිදත්සඟරා** කතුවරයාගේ විග්‍රහාත්මක වාක්‍යයට 'බලයක්' ගොඩනඟන කරුණාතිලකයන් **සිදත්සඟරා** සමාස රීති පහ ද සම්මත කොට ඇත්තේ නම් භාවිතයෙන්, අර්ථකථන හා උදාහරණවලිනි. 'සමාස ප්‍රභේද පහක් **සිදත් සඟරාවේ** වේ. ඒ '**අවිය සමස්, විබත් සමස්, වෙසෙසුන් සමස්, අන්අරුත් සමස්, ද අරුත් සමස් වී සමස් පස් වැදෑරුම්**' (2004: 249) ලෙස ය. අනතුරුව මේ පස් වැදෑරුම් සමාස විධිය නිර්දේශීකරණය කොට ඇත්තේ **සිදත්සඟරා** අර්ථකථනය, නිදර්ශන සැපයීම සම්මතකරණය කිරීමෙන් ම පමණක් නොව තම මතාකල්පවලින් ද පෝෂණය කරමිනි (2004: 249-260).

අව්‍ය සමාසය කථනය, ප්‍රභේද දැක්වීම (යව්, කු, ප, න) හා නිදර්ශන ඉදිරිපත් කිරීම හා විභක්ති සමාසය (විබත් සමස්) දැක්වීම ද **සිදත්සඟරාවේ** ඉදිරිපත් කිරීම් සම්මතකරණයකි. **සිදත්සඟරා** කතුවරයා විභක්ති සමාස හත සඳහා විග්‍රහාත්මක කථන ඉදිරිපත් නොකළ ද සංකල්ප ගොඩනඟමින් **සිදත්සඟරා** නිදර්ශන වැඩි වශයෙන් භාවිත කරමින් කරුණාතිලකයන් **සිදත්සඟරාවේ** ඉදිරිපත් කිරීම් ම සම්මතකරණය කොට තිබේ. කර්ම විභක්තිය - ගවපල් සම්ප්‍රදාන විභක්තියේ - පින්හාල්, ගුරුපඬුරු අවධි විභක්තියේ දී රජබිය, සම්බන්ධ විභක්තියේ - හරක්මස්, සුරබොජුන්, ආධාර විභක්තියේ දී ගම්වැසි, මුහුදුදිය යන නිදර්ශන **සිදත්සඟරා** දැක්වීම්වලට අමතර ව එකතු කොට ඇති සමාස නිදර්ශනය (2004: 251-252). විභක්ති (විබත්) සමාසයේ ද අලුප්ත සමාසය පිළිබඳ දැක්වීම්වලින් **සිදත්සඟරා** මතය නවීකරණයකට හසුකොට තිබේ (2004: 253) (2004: 250-251). **සිදත්සඟරා** කතුවරයාගේ විශේෂණ සමාසය (වෙසෙසුන් සමස්) විග්‍රහය ද නිර්දේශීකරණය කරන කරුණාතිලක **සිදත්සඟරාවේ** නිදර්ශන ද උපයෝගි කොටගෙන පූර්ව හා පර



පදවල ලක්ෂණ මත පස්වැදෑරුම් කොට දක්වමින් වෙසෙසුන් සමස් දැක්වීමට විධිමත් බවක් ගොඩනඟා තිබේ (2004: 53-54).

අන්‍යාර්ථ සමාසය (අනරුත් සමස්) විග්‍රහයේ දී 'වෙනස් වෙනස් අර්ථ ඇති පද සමාස වීමෙන් අනතුරුව එකී පදවල අර්ථයෙන් පරිබාහිර වූ/අන්‍ය වූ අර්ථයක් සමාසයෙන් පැවසේ නම් ඒ අන්‍යාර්ථ සමාසයයි. " සමාසාර්ථය, වාච්‍යාර්ථය හා ව්‍යාකරණාර්ථය හෙවත් විභක්ත්‍යර්ථය යනුවෙන් දෙවැදෑරුම් ය.' (2004: 255) යන්න අන්‍යාර්ථ සමාසයේ මූලික ලක්ෂණ ප්‍රකට කරන කරුණාතිලකයන් **සිදත්සඟරාවේ** දැක්වීම ද ඉදිරිපත් කරමින් සම්මත කොට ඇත්තේ **සිදත්සඟරා** විග්‍රහය තම මතයෙන් පෝෂණය කොට ඇති බව හුවා දක්වමින්ය. අනතුරුව විභක්ත්‍යර්ථ වශයෙන් සත්වැදෑරුම් වන ආකාරයත් නැවත තද්ගුණ (තගුණ) හා අතද්ගුණ (අතගුණ) දෙවැදෑරුම් බවත් සහ/සමාන යන අරුතින් සහ නිපාත පූර්ව ව අන්‍යාර්ථ සමාසය සැකසෙන අයුරු නිරූපණය කොට ඇත්තේ **සිදත්සඟරා** නිදර්ශන ද උපයෝගී කොටගෙන ය. එහි දී **සිදත්සඟරා** කතුවරයා විභක්ති නාමීකරණය කොට නිදර්ශන දක්වා නැති වුව ද කරුණාතිලකයන් විභක්ත්‍යර්ථ වශයෙන් ගෙන **සිදත්සඟරා** නිදර්ශන ඒ හතට ඇතුළු කරමින් පැහැදිලි කිරීමක් සිදුකොට තිබේ. **සිදත්සඟරාවේ** තද්ගුණ (තගුණ) හා අතද්ගුණ (අතගුණ) භේදය සහිත සමානාර්ථවත් සහ නිපාත පූර්ව ව සැකසෙන අන්‍යාර්ථ සමාසය ද සම්මත කරන කතුවරයා කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවදි යන විභක්ති අර්ථ සහිත අන්‍යාර්ථ සමාස පදවල පූර්ව පදය කෘදන්ත පදයක් බවත් සමාසවල 'පදගතාර්ථයෙන්/වාච්‍යාර්ථයෙන්' අන්‍ය අර්ථ ඇති වන විභක්ති සමාස ද සිංහල භාෂා ව්‍යවහාරයේ පවතින බව නිදසුන් ඇසුරෙන් දක්වමින් ද තුල්‍යාධිකරණ හා භින්නාධිකරණ අන්‍යාර්ථ සමාස එකතු කරමින් ද **සිදත්සඟරා** නිර්දේශය පෝෂණය කොට තිබේ (2004: 258-259).

> සමුච්චයාර්ථවාචී 'ද' නිපාතයෙන් සම්බන්ධ කළ හැකි නාම පද කිහිපයක් එම නිපාතය නො මැතිව සමාස භාවයට පත් වේ ද ඒ **'ද' කාරාර්ථ** සමාසයි (2004: 259).

**සිදත්සඟරා** න්‍යායය නවාකාරයට ගෙනහැර දක්වන කරුණාතිලකයන් අඞ්ග, සමුදාය ප්‍රධාන හා ගර්භ සමාස ලෙස 'ද කාරකාර්ථ' සමාසයේ ප්‍රභේද තුනක් පෙන්වා දෙන්නේ **සිදත්සඟරා** දක්වීම් අර්ථවත් කරමින් මෙන් ම නව්‍යකරණයට ද හසු කරමිනි (2004: 260). සිංහල භාෂාවේ භාවිතයන් අළලා සමාස ස්වරූපය හඳුනාගන්නා කරුණාතිලකයන් ස්වාභිමතය දක්වා ඇත්තේ **සිදත්සඟරා** නිර්දේශීකරණයට අර්ථවත් බවක් එකතු කරමිනි. ඒ අනුව සමාස විග්‍රහය මුල්කරගෙන මෙහි දී **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතිය වැදගත් වන්නේ **සිදත්සඟරා** සඳහන් **සම්මතකරණය, ප්‍රතිපෝෂණය කිරීම** හා **විධිමත් වර්ගීකරණයකට හසු කිරීම** යන ත්‍රිත්ව කරුණු පදනම් කරගෙන ය.

**සිදත්සඟරාවේ** 'උක්තානුක්තාධිකාරය' හා 'කිරියකරුපදසබඳ' සඳහා පරිච්ඡේද දෙකක් වෙන් ව තිබුණත් **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ උක්තාඛ්‍යාත සම්බන්ධය සඳහා එක් පරිච්ඡේදයක් වෙන් කොට ඇත. **සිදත්සඟරා** කතුවරයාගේ 'උක්තානුක්තාධිකාරය' නමැති පරිච්ඡේදය කිරීමේ මූලික අරමුණ වී ඇත්තේ උක්තානුක්ත භේදය පැහැදිලි කිරීම ය. එහි දී කර්ම, කර්තෘ අර්ථ විභක්ති භජනයේ දී අනුක්ත වන බවත්, ඒ කර්ම, කර්තෘ අර්ථ ප්‍රථමා විභක්තිය භජනයේ දී උක්ත වන බවත් **සිදත්සඟරා** කතුවරයාගේ පෙන්වා දීම ය. කර්තෘ හා කර්මකාරක වාක්‍යයවල දී කර්ම, කර්තෘ උක්ත අනුක්ත භාවයන් ගන්නා ආකාරයත් විවිධ නිදර්ශන ඇසුරෙන් මෙහි දී පැහැදිලි කොට තිබේ (**සිවිස**, 1902: 179-183). **සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ උක්තාඛ්‍යාත සම්බන්ධය **සිදත්සඟරා** දක්වීමට වඩා සංකීර්ණ බව පෙනී යන්නේ උක්ත ආඛ්‍යාත සම්බන්ධය ගොඩනැගෙන අයුරු භාෂාවේ විවිධ ප්‍රයෝග ආශ්‍රයෙන් පැහැදිලි කිරීමට උත්සාහ ගෙන ඇති බැවිනි. ප්‍රභේද හතලිහක් යටතේ සිංහල භාෂාවේ භාවිත වාක්‍යයන්හි උක්තාඛ්‍යාත සම්බන්ධය පිළිබඳ අවධානයට හසුකොට තිබේ. (2004: 261-280). එය දීර්ඝ විග්‍රහයකි. කරුණාතිලකයන් **සිදත්සඟරාවේ** ක්‍රියාකාරක පද සම්බන්ධය (කිරියකරු පද සබඳ)



විග්‍රහය ද ඇතුළු කොට ඇත්තේ උක්තාඛ්‍යාත සම්බන්ධයට ම ය (2004: 280-282). **සිදත්සඟරා** කතුවරයා ක්‍රියාකාරක පද සම්බන්ධා'ධිකාරයේ දී ඇති නිදර්ශන ද දක්වා ඇති කරුණාතිලකයන් 'වර්තමාන සම්ප්‍රදායයෙහි වැකියක ක්‍රියා කාරක පද සම්බන්ධය දක්වීමේ දී නිර්දේශ වනුයේ **කර්තෘ-කර්ම-ක්‍රියා** යන අංග තුන පමණක් බැව් පෙනේ (2004: 282). එහි දී කතුවරයා, ඔහුගේ ස්වාධීන නිර්දේශිතය ඉදිරිපත් කොට තිබේ.

**සිංහල භාෂා ව්‍යාකරණය** කෘතියේ උක්තාඛ්‍යාත සම්බන්ධයේ දී කාලීන ව්‍යවහාරයේ භාවිත වාක්‍ය ඇසුරෙන් රීති ගණනාවක් පෙන්වා දීම වාක්‍ය නිර්මාණය කිරීමේ ප්‍රධාන ක්‍රමවේද ඉදිරිපත් කිරීමක් වශයෙන් සැලකිය හැකි අතර ක්‍රියා කාරක පද සම්බන්ධයේ දී **සිදත්සඟරා** දක්වීම සම්මතකරණය කරමින් ස්ව මතාකල්පය ද ඊට එක් කොට ක්‍රියාකාරක පද සම්බන්ධයේ ස්වරූපය පෙන්වීමට උත්සාහ දරා ඇතැයි කිව හැකිය.

කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර යන විභක්ති හයට ජේකයන් කාරක නාමය භාවිත කළ බව පෙන්වා දෙන **සිදත්සඟරා** කතුවරයා සම්බන්ධ හා ආලපන, සම්බන්ධ ක්‍රියා නිෂ්පත්තියට හේතු නොවේ යැයි සිතා බැහැර කොට තිබේ (**සිවිස**, 1902: 184-185). **සිදත්සඟරාවේ** 'කිරියකරු පද සබඳ' පාදක දක්වීම ද ඉදිරිපත් කරමින් කාරක හය උපයෝගී කොටගෙන නිදර්ශන ඇසුරෙන් කරුණාතිලකයන් ක්‍රියාකාරක පද සම්බන්ධය පැහැදිලි කොට ඇත්තේ වර්තමාන ව්‍යවහාර භාෂාවේ භාවිත වාක්‍ය නිදර්ශන වශයෙන් ගෙන පැහැදිලි කරමින්ය (2004: 281-282). ඒ අතර **සිදත්සඟරාවේ** ඉදිරිපත් කොට ඇති නිදර්ශන වෙන් කොට විභක්ති ප්‍රත්‍යය දක්වා තිබේ (2004: 64-68). **සිදත්සඟරා** කතුවරයා විභක්ති ප්‍රත්‍යය (ඒකවචන, බහුවචන) දක්වා ඊට නිදර්ශන සැපයීම ප්‍රධාන කොටගෙන තිබුණත් කරුණාතිලකයන් නාම පද වරනැඟීමට ප්‍රධාන ස්ථානයක් ලබා දී තිබේ.

**සිදත්සඟරාව** සිංහල භාෂාව සඳහා සම්පාදනය වූවක්, පද්‍යකරණය සඳහා රචනා වී ඇති ව්‍යාකරණ ග්‍රන්ථයක් වශයෙන් ගෙන එහි පවත්නා ප්‍රාමාණික බව හා ඌනතා යැයි සැලකූ විවිධ ප්‍රයෝග සඳහා විසිවන සියවසේ දී විද්වතුන් විසින් විවිධ වූ ප්‍රතිමත හා සිද්ධාන්ත ගොඩනඟන ලදි. ඒ අතර මේ අධ්‍යයනයට පාදක

කරගනු ලැබුවේ මහාචාර්ය ඩබ්ලියු. එස්. කරුණාතිලකයන්ගේ ඉදිරිපත් කිරීම්ය. වර්තමානයේ බිහි ව ඇති ව්‍යාකරණ ග්‍රන්ථ අතුරෙන් පොදු වියත් මෙන් ම සමාජ බහුතර ආකල්පයෙන් උසස් ව්‍යාකරණ කෘතියකැයි පිළිගැනෙන '**සිංහල භාෂා ව්‍යාකරණය**' **සිදත්සඟරාව** ද ආශ්‍රය කරගෙන විමසීමේ දී විශේෂයෙන් හඳුනාගතහැකි කරුණු කිහිපයකි. **සිදත්සඟරා** කතුවරයා කාලීන අවශ්‍යතා ප්‍රස්තුතව සම්ප්‍රදායයේ ම නොපිහිටා ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනය කළ යුතු යැයි පෙන්වා දුන් ආදර්ශය සම්මතකරණය කරමින් කාලීන අවශ්‍යතාවලට සුදුසු ආකාරයට ව්‍යාකරණ ග්‍රන්ථයක් සම්පාදනය කිරීම, ජේක ව්‍යවහාරයෙන් ගතයුතු රීතින් ඇතුළු විවිධ භාෂාංග ලබාගැනීම හා එමගින් තම ග්‍රන්ථය පෝෂණය කිරීම, නව රීති එකතු කිරීමේ දී ව්‍යවහාර භාෂාව මුල්කරගැනීමේ **සිදත්සඟරා** කර්තෘගේ නිර්දේශය ම ක්‍රියාත්මක කිරීම හා **සිදත්සඟරාව** හෝ වෙනත් ව්‍යාකරණ ග්‍රන්ථවල ඌනතා පෙන්වීමට නොපෙළඹී ඒ ග්‍රන්ථාභාසය ඇතුව විධිමත් ව්‍යාකරණ ග්‍රන්ථයක් නිර්මාණය කිරීම පාදකවයි. ඒ අනුව **සිංහල භාෂා ව්‍යාකරණ** කෘතියෙන් **සිදත්සඟරා** ව්‍යාකරණ ප්‍රයෝග සම්මතකරණය, ප්‍රතිසංස්කරණය හා නවීකරණයට හසුව ඇති බව කිව හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

### සිංහල


1. අදිකාරි, අබේරත්න. (1996). 'සිංහල භාෂාවේ සම්භාව්‍ය ව්‍යාකරණ ග්‍රන්ථය' **සම්භාෂා.** කලාපය - 7. බත්තරමුල්ල: අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව. 102-123.
2. අදිකාරි, ඒ. (1994). 'සම්භාව්‍ය ලේඛන හා ව්‍යාකරණ සම්ප්‍රදායයෝ' **සම්භාෂා.** චතුර් මාසික අධ්‍යයන සංග්‍රහය - කලාපය - 6. බත්තරමුල්ල: පිරිවෙන් හා ආගමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව. 87-23.
3. අභයසිංහ, ඒ. ඒ. (1998). **ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව.** කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.
4. කරුණාතිලක, ඩබ්ලිව්. එස්. (1989). 'සිංහල වියරණ විදි' **භාෂා විඥාන.** භාෂා විෂයක ලිපි සංග්‍රහය - 1. රදාවාන: අබයරත්න මුද්‍රණාලය. 58-63.
5. එම, (1995). **සිංහල භාෂා ව්‍යාකරණය.** (පස්වන මුද්‍රණය - 2004). කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.





6. එම, (2005). **භාෂා සමීක්ෂා.** (ලිපි සංග්‍රහය). (දෙවන මුද්‍රණය - 2006). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
7. කුමාරණතුංග, මුණිදාස (1935). **සිදත් සඟරා විවරණය.** (ප්‍රථම භාගය). කොළඹ: කේ. ඩී. පෙරේරා සහ පුත්‍රයා.
8. එම, (2479) **ක්‍රියා විවරණය.** (තුන් වන සැකැස්ම - මුද්‍රණය - 1999). කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
9. එම, (2481). **ව්‍යාකරණ විවරණය.** (දෙ වන සැකැස්මේ දෙ වන පැහැරැවුම (1958). කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
10. කුමාරණතුංග, මුනිදාස හා ගුණවඩු, අමරසිරි. (2508) **සිදත් සඟරා විවරණය.** කොළඹ: අනුල පහරුවෙහි.
11. ගයිගර්, විල්හැම්. (1937). **සිංහල භාෂාවේ ව්‍යාකරණය.** *(A Grammar of the Sinhala Language)*. සිංහල පරිවර්තනය - (1964), (නැවත මුද්‍රණය 2005). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
12. ගුණවර්ධන, ඩබ්ලිව්. එෆ්. (1924). **සිද්ධාන්ත පරීක්ෂණය හෙවත් ස්වභාෂා නීතිසාරය.** කොළඹ: එන්. ජේ. කුරේ. (දෙවන මුද්‍රණය - 1959). කොළඹ: එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.
13. එම, (1971). (සංස්.). **සිදත්සඟරා පුරාණ සන්නය.** කොළඹ: අනුල මුද්‍රණාලය.
14. ද සිල්වා, ම. ව. සුගතපාල. (1963). **භාෂා විමර්ශනය.** මහරගම: සමන් ප්‍රකාශකයෝ.
15. එම, (1965). ***'Some Observation on the Scope of the Sidat Sańgarāwa - Paranavithana Felicitation Vollume'*** ග්‍රන්ථයට සැපයූ ලිපියේ සිංහල අනුවාදය (2002). මැදගම පඤ්ඤාලෝක. **සම්භාෂා.** 12 වැනි කලාපය. කොළඹ: අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව. 652-675.
16. ධම්ම පරායන තිස්ස, බුජ්ජම්පොල, සිරි ඤාණිස්සර, අටබාගේ ආනන්ද. (1966). **සිදත් සඟරා විචාරය සහ සරසවි වියරණය.** වෙන්නප්පුව: පීරිස් මුද්‍රණාලය.
17. පඤ්ඤාසාර, ඔක්කම්පිටියේ (2004). **සිදත්සඟරා විමසුම.** කොළඹ: S & S මුද්‍රණාලය.


### ENGLISH


1. Anshen, Frank (2001). 'Language Planning' *The Handbook of Linguistics*. Oxford: Blackwell Publishing Ltd. 704-713.
2. Auty, R. (1973). 'The role of purism in the development of the Slavonic literary Languages' *Slavonic and East European Review 51*: pp 335-343.

3. Christian, Donna (1988). ‘Language Planning' the view from Linguistics in Frederick, J. Newmeyer, *Language: the Socio-Cultural Context*. Cambridge: Cambridge University Press. 193-211.
4. Cooper, R. L. (1989). *Language Planning and Social Change*. New York: Cambridge University Press.
5. Jernudd, B. H. and Shapiro, H. J. (1989). *The Politics of Lnguages Parism*. Berlin: Mouton.
6. Josheph. (1987). Eloquence and Power. *The Rise of Language Standards and Standard Language*. New York: Basil Blackwell.
7. Nahir, Moshe. (1974). ‘Language Academics, Language Planning, and the Case of the Hebrew Revival.' Dissertation, University of Pittsburgh.
8. do, (1984). ‘Language Planning Goals: A Classification' *LanguageProblemsandLanguage Planning*. 8: 3. pp. 294-327. Reprinted in Paulston. C. B. & Tucker, G. R. (eds.). (2003). *Sociolinguistics: The Essential Readings*. London: Blackwell. 423-448.